## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ පහක කාල පරිච්ඡේදය සඳහා ආදායම, හානි පූරණ ගෙවීම සහ ඒ මත දරන ලද වියදම පිළිබඳ සැසඳීමක් පහත දැක්වේ. මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවය එයින් දැක්වේ.

| වර්ෂය | ලැබුණු වාරික | හිමිකම් ගෙවීම | මෙහෙයුම් වියදම | පරිපාලන වියදම | මුළු වියදම | ලැබුණු වාරික වලට වැඩි වියදම |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2007 | 37.5 | 21.3 | 1.5 | 27.5 | 50.3 | (12.8) |
| 2008 | 70.5 | 27.0 | 4.2 | 78.7 | 109.9 | (39.4) |
| 2009 | 83.4 | 31.0 | 5.7 | 84.1 | 120.8 | (37.4) |
| 2010 | 105.1 | 268.7 | 5.6 | 86.3 | 360.6 | (255.5) |
| 2011 | 157.4 | 57.3 | 10.1 | 82.3 | 149.7 | 7.7 |

(ආ) වී සහ අතිරේකභෝග වගා රක්ෂණ යෝජනා ක්‍රම වලට අදාලව විශාල වියදමක් දරා තිබුණු බව නිරීක්ෂණය වූ අතර එය සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල වලට අදාලව අහිතකර ලෙස බලපා තිබුණි.

| | රක්ෂණ යෝජනා ක්‍රමය | ආදායම | මුළු මෙහෙයුම් වියදම | ආදායමේ ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් වියදම |
|---|---|---|---|---|
| | | රු. | රු. | % |
| (i) | වී | 94,437,031 | 173,924,975 | 184.0 |
| (ii) | පශු සම්පත් | 18,235,472 | 7,454,577 | 40.0 |
| (iii) | සුව සෙත | 6,953,530 | 572,340 | 8.0 |
| (iv) | උපයෝගී වගා | 25,548,995 | 67,420,410 | 263.0 |
| (v) | කෘෂි උපකරණ | 5,881,549 | 74,850 | 1.0 |

### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කර තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 9 හි දක්වා ඇති පරිදි එය ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.2,186,726 ක් වු පහත දැක්වෙන සේවක ණය සහ අත්තිකාරම් දීර්ඝ කාලයක සිට අයකර ගැනීමෙන් තොරව ගිණුම් වල පැවතුණි.

| | රු. |
|---|---|
| ආපදා ණය | 1,385,858 |
| උත්සව අත්තිකාරම් | 51,300 |
| විශේෂ අත්තිකාරම් | 14,800 |
| ඉන්ධන අත්තිකාරම් | 160,601 |
| යතුරු පැදි ණය | 245,072 |
| විශේෂ සේවක ණය | 4,800 |
| විවිධ අත්තිකාරම් | 324,293 |
| | 2,186,724 |

(ආ) එකතුව රු.1,257,416 ක් වු හිඟහිටි සේවක ණය ශේෂ දීර්ඝ කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රු.149,044,122 ක මුදලක් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලබාදී තිබුණි. කෙසේ වුවද එම මුදල 2012 ජුලි 31 දක්වා ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

### 1.2.4 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් අවසථා විගණනයේදී නිරීක්ෂණය විය.

<u>ආයතන සංග්‍රහය</u>

| | | |
|---|---|---|
| (i). | XXIV පරිච්ඡේදයේ 7 (v) වගන්තිය | සේවකයන් 10 දෙනෙකුට යතුරු පැදි ණය ලබාදීමේදී , මිලදී ගත් යතුරු පැදි වල අයිතිය තහවුරු කිරීම සඳහා ඒවා ලියාපදිංචි කිරීමේ සහතික බලයලත් නිලධාරීට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii). | XXIV පරිච්ඡේදයේ 3 (i) වගන්තිය | රු.150,000 බැගින් යතුරු පැදි ණය ලබාගත් සේවකයන් 3දෙනෙකු විසින් ඒවා අදාළ කාරණයන් සඳහා යොදා ගෙන නොතිබුණි. |

### 1.2.5 බලයනොලත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 427 දරන අභ්‍යන්තර චක්‍රලේඛය අනුව, කෘෂිකාර්මික කටයුතු සිදුකරන පුද්ගලයන් පමණක් බඳවා ගත යුතු වුවත් කෘෂිකාර්මික කටයුතු වල නොයෙදෙන පුද්ගලයන් බඳවා ගෙන තිබු බව නිරීක්ෂණය විය.

(ආ) 2009 අප්‍රේල් 24 දිනැති අංක 424 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සතුන්ගේ ලේබල ලබාගැනීමෙන් තොරව මැරුණු සතුන්ගේ හිමිකම් සඳහා ගෙවා තිබු බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

| ලේබල අංකය | වටිනාකම |
|---|---|
| | රු. |
| TCI-2010/12 | 26,800 |
| 21/33/139/3 | 44,800 |
| 503 | 17,800 |
| ND589 | 44,800 |
| TCI505 | 22,800 |
| | 156,500 |

(ඇ) 2009 අප්‍රේල් 24 දිනැති අංක 424 දරන අභ්‍යන්තර චක්‍රලේඛයෙහි නියෝග කර ඇති පරිදි වෛද්‍ය සහතික ලබාගැනීමට පෙර රක්ෂණ ආවරණ සඳහා ගෙවා තිබු අවස්ථා නිරීකෂණය විය. උදාහරණ පහත පරිදි වේ.

| රක්ෂණ කාලය | සහතිකයේ දිනය |
|---|---|
| 2009 අගෝස්තු 04 / 2012 අගෝස්තු 03 | 2009 අගෝස්තු 20 |
| 2009 අගෝස්තු 24 / 2012 අගෝස්තු 22 | 2009 සැප්තැම්බර් 02 |
| 2010 අප්‍රේල් 27 / 2011 අප්‍රේල් 26 | 2010 මැයි 06 |
| 2010 ජුනි 22 / 2011 ජුනි 21 | 2010 ජුනි 23 |

### 1.2.6 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තක්සේරු දිනයන් වෙනස්කර එකතුව රු.948,429 ක් වු හානි රක්ෂණ ගෙවා තිබුණි.

(ආ) වී රක්ෂණ වලට අදාලව අසම්පූර්ණ ඉල්ලුම්පත් මත එකතුව රු.10,271,559 ක් වු හානි රක්ෂණ ගෙවා තිබුණි.

(ඇ) මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවීන් 49 දෙනෙකුට 2010/2011 මහ කන්නය තුළ රු.1,099,780 ක් වු හානි රක්ෂණ ගෙවීම් දෙවරක් ගෙවා තිබුණි. මෙම ගෙවීම් වලින් රු.809,140 ක් පමණක් 2012 ජූලි 31 දක්වා අයකර ගෙන තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් අතිරික්තය පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.101,215,444 ක් වු අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය රු.149,328,370 ක් විය. සමාලෝචිත වර්ෂයේ ලැබුණු රු.68,998,243 ක් වු රජයේ ප්‍රදාන හා අනිකුත් ආදායම් ගැලපීමෙන් පසු සමස්ථ අතිරික්තය රු.87,675,318 ක් වු අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ලැබුණු රජයේ ප්‍රදාන හා වෙනත් ආදායම් රු.88,511,376 ක් ගැලපීමෙන් පසු ඉකුත් වර්ෂයේ සමස්ථ ඌනතාවය රු.147,406,522 ක් විය. ඒ අනුව සමස්ථ අතිරික්තයේ රු.235,081,840 ක වර්ධනයක් දැක්වුණි.
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| විෂයය | ප්‍රවර්ථන වර්ෂය 2011 | පෙර වර්ෂය 2010 | පෙර වර්ෂයෙන් වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු.(000) | රු.(000) | % |
| රක්ෂණ වාරික | 157,417 | 105,062 | 50 |
| පොලී | 11,268 | 19,923 | (43) |
| මුළු මෙහෙයුම් ආදායම | 168,685 | 124,985 | 35 |
| මෙහෙයුම් වියදම | 67,470 | 274,313 | (75) |
| මෙහෙයුම් අතිරික්තය / (ඌනතාවය ) | 101,215 | (149,328) | 168 |
| පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 62,750 | 85,500 | (27) |
| වෙනත් ආදායම | 6,248 | 3,011 | 108 |
| පරිපාලන, මූල්‍ය හා වෙනත් වියදම් | (82,538) | (86,589) | (5) |
| ශුද්ධ අතිරික්තය / ( ඌනතාවය ) | 87,675 | (147,406) | 159 |
| කෘෂි. ර.ම. සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදන | 5,060 | - | - |
| ප්‍රතිපාදනයෙන් පසු ශුද්ධ අතිරික්තය / (ඌනතාවය ) | 82,615 | (147,406) | 156 |

ඉහත වර්ධනය සඳහා පහත දැක්වෙන කරුණු හේතුවී තිබුණි.

(i) වී රක්ෂණය වැඩිවීම හේතුවෙන් පෙර වර්ෂය හා සැසඳීමේදී රක්ෂණ වාරික 50% කින් වැඩිවී තිබුණි.

(ii) ආපදා අවස්ථාවක් ඇති නොවීම හේතුවෙන් පෙර වර්ෂය හා සැසඳීමේදී මෙහෙයුම් වියදම 75% කින් අඩුවී තිබුණ.

(iii) ස්ථාවර වත්කම් අපහරණය කිරීම හේතුවෙන් පෙර වර්ෂය හා සැසඳීමේදී වෙනත් ආදයම 108% කින් වැඩිවී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵලය අනුව , රජයේ ප්‍රදාන වලට පෙර ශුද්ධ අතිරික්තය ක්‍රමයෙන් අඩුවී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| මුළු ආදායම | 175 | 128 | 114 | 96 | 48 |
| මුළු වියදම | 150 | 361 | 121 | 134 | 50 |
| ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය) | 25 | (233) | ( 7) | (38) | (2) |
| රජයේ ප්‍රදාන | 63 | 85 | 75 | 42 | 12 |
| රජයේ ප්‍රදාන වලින් පසු ශුද්ධ අතිරික්තය/ ( ඌනතාවය ) | 88 | (148) | 68 | 4 | 10 |

2007 සිට 2010 කාල පරිච්ඡේදය තුළ මණ්ඩලය රජයේ ප්‍රදාන මත යැපෙන බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

**රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය**

ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා රක්ෂණ යෝජනා ක්‍රමවල භෞතක හා මූල්‍ය කාර්ය සාධනය පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විෂයය | මිණුම | ඉලක්කය | | | | ඉටුකරගැනීම | | | | ඉටුකර ගැනීම ප්‍රතිශතයක් ලෙස % | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | |
| | | 2010 | 2011 | 2010 (රු.000) | 2011 (රු.000) | 2010 | 2011 | 2010 (රු.000) | 2011 (රු.000) | 2010 % | 2011 % | 2010 (රු.000) | 2011 (රු.000) |
| 1. භෝග රක්ෂණය | | | | | | | | | | | | | |
| (අ) වී | අක්කර | 60,000 | 90,519 | 48,000 | 71,371 | 65,572 | 101,741 | 53,010 | 94,437 | 109.2 | 112.40 | 110.44 | 132.32 |
| (ආ) මිරිස් | අක්කර | 500 | 823 | 700 | 1,411 | 194 | 431 | 364 | 826 | 38.80 | 52.00 | 52.00 | 58.54 |
| (ඇ) ලොකු ළූණු | අක්කර | 600 | 341 | 1,920 | 3,386 | 1,021 | 998 | 2,719 | 2,744 | 170.1 | 292.67 | 141.61 | 81.04 |
| (ඈ) පොල් | අක්කර | 975 | 130 | 1,053 | 140 | 10 | 5 | 11 | 11 | 1.03 | 3.85 | 1.04 | 7.86 |
| (ඉ) උක් | අක්කර | 1,300 | 1,040 | 3,055 | 2,570 | 63 | 30 | 377 | 28 | 4.85 | 2.88 | 12.34 | 1.09 |
| (ඊ) බඩ ඉරිඟු | අක්කර | 15,500 | 12,065 | 17,050 | 18,583 | 11,101 | 9,788 | 17,977 | 16,263 | 71.62 | 81.13 | 105.44 | 87.52 |
| (උ) අපනයන හා පාරම්පරික භෝග | අක්කර | 600 | 1,376 | 1,680 | 3,759 | 107 | 14 | 239 | 49 | 17.83 | 1.02 | 14.23 | 1.30 |
| (ඌ) මල් පැල | මල් පැල | | 64,752 | 400 | 261 | | - | 6 | - | | - | 1.50 | - |
| (එ) වගා භෝග | අක්කර | 416 | 222 | 832 | 444 | 16 | 756 | 42 | 709 | 3.85 | 340.54 | 5.05 | 159.68 |
| (ඒ) අර්තාපල් | අක්කර | 200 | 600 | 1,000 | 3,037 | 518 | 817 | 2,095 | 2,919 | 259.00 | 136.17 | 209.5 | 96.11 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (ඔ) | වෙනත් භෝග | අක්කර | 900 | 5,236 | 450 | 3,751 | 2,756 | 1,076 | 1,985 | 1,130 | 306.2 | 20.55 | 441.11 | 30.13 |
| | (ඕ) | එළවළු | අක්කර | 300 | 375 | 900 | 1,273 | 521 | 889 | 807 | 869 | 173.6 | 237.07 | 89.67 | 68.26 |
| 2. | පශු සම්පත් | | | | | | | | | | | | | | |
| | | ගවයින් | සංඛ්‍යාව | 11,000 | 11,200 | 27,500 | 25,928 | 5,631 | 12,982 | 11,334 | 16,729 | 51.19 | 115.91 | 41.21 | 64.52 |
| | | එළුවන් | සංඛ්‍යාව | 8,000 | 11,646 | 2,500 | 6,140 | 3,219 | 2,837 | 1,436 | 1,506 | 40.24 | 24.36 | 57.44 | 24.53 |
| 3. | ගබඩා | | සංඛ්‍යාව | 1,000 | 1,063 | 5,000 | 4,897 | 10 | 5 | 178 | 44 | 1.00 | 0.47 | 3.56 | 0.9 |
| 4. | කෘෂි උපකරණ | | සංඛ්‍යාව | 2,000 | 3,645 | 7,000 | 13,600 | 454 | 402 | 3,225 | 5,881 | 22.70 | 11.03 | 46.07 | 43.24 |
| 5. | සුවසෙත | | සංඛ්‍යාව | 40,000 | 36,085 | 16,000 | 15,478 | 20,618 | 13,181 | 8,456 | 6,953 | 51.54 | 36.53 | 52.85 | 44.92 |
| 6. | ජීවිත රක්ෂණ | | සංඛ්‍යාව | 15,000 | 12,069 | 45,000 | 10,189 | - | 8,105 | - | 7,272 | 0 | 67.16 | 0 | 71.37 |

මේ සම්බනධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොල් , උක් , අපනයන , පාරම්පරික භෝග , වෙනත් භෝග , එළුවන් , ගබඩා කෘෂ උපකරණ හා සුව සෙතට අදාල රක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් භෞතික ඉලක්ක 50 % ක් දක්වා හෝ ඉටුකර ගෙන නොතිබුණි. පොල් , උක් , පාරම්පරික භෝග හා ගබඩා රක්ෂණයට අදාල භෞතික ඉලක්ක 5% කට අඩු ප්‍රමාණයක් පමණක් ඉටුකර ගෙන තිබුණි.

(ආ) පොල් , උක් , අපනයන , පාරම්පරික භෝග , මල් පැල , වෙනත් භෝග , එළුවන් , ගබඩා කෘෂිඋපකරණ හා සුවසෙතට අදාළ රක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් මූල්‍ය ඉලක්කයන් 50% ක් දක්වා හෝ ඉටුකර ගෙන නොතිබුණි. පොල් , උක් , අපනයන පාරම්පරික භෝග , මල් පැල හා ගබඩා රක්ෂණය සම්බන්ධයෙන් මූල්‍ය ඉලක්කයන් 10 % කට අඩු ප්‍රමාණයක් පමණක් ඉටුකර ගෙන තිබුණි.

(ඇ) ලොකු ළූණු , උක් , බඩ ඉරිඟු , අපනයන , පාරම්පරික භෝග , අර්තාපල් , වෙනත් භෝග එළවළු ,එළුවන්, ගබඩා , කෘෂි උපකරණ හා සුවසෙත රක්ෂණය සම්බන්ධයෙන් ඉලක්ක ඉටුකර ගැනීම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අඩුවී තිබුණි.

(ඈ) මල් පැල රක්ෂණය සම්බන්ධයෙන් භෞතික හා මූල්‍ය ඉලක්ක පිළිවෙලින් 64,752 ක සංඛ්‍යාවක් හා රු.මිලියන 0.261 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද , සමාලෝචිත වර්ෂය තුළ එක් පැලයක් හෝ රක්ෂණය කර නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාගත හැකිවූ තොරතුරු අනුව , වාහන 9 ක් මන්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දීර්ඝ කාල පරිච්ඡේදයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) රු.382,111 ක් වටිනාකම වු භාවිතයට නොගන්නා මුද්‍රණ ද්‍රව්‍ය තොගයක් හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු.451,509 ක් වටිනාකම වු උපකරණ 1982 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

## 3.3 ව්‍යාපෘති ප්‍රමාදයන්

--------------------

ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2008 වර්ෂයේදී ඉඩමක් සංවර්ධනය කිරීම සඳහා රු.585,800 ක මුදලක් දරා තිබුණු අතර 2011 මූල්‍ය ප්‍රකාශන වල අත්තිතාරමක් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද එම ඉඩම දීර්ඝ කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

## 3.4 සේවක මණ්ඩල කළමනාකරණය

-----------------------------------

ලබාගත හැකිවූ තොරතුරු අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ 03 ක් සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය දිනට | | | තථ්‍ය කාර්ය මණ්ඩලය දිනට | | | පුරප්පාඩු කාර්ය මණ්ඩලය දිනට | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 දෙසැ. 31 | 2010 දෙසැ. 31 | 2009 දෙසැ. 31 | 2011 දෙසැ. 31 | 2010 දෙසැ. 31 | 2009 දෙසැ. 31 | 2011 දෙසැ. 31 | 2010 දෙසැ. 31 | 2009 දෙසැ. 31 |
| විධායක | 56 | 45 | 45 | 38 | 39 | 41 | 18 | 06 | 04 |
| විධායක නොවන | 285 | 264 | 263 | 235 | 176 | 193 | 50 | 88 | 70 |
| කණිෂ්ඨ සේවක | 80 | 69 | 70 | 60 | 60 | 53 | 20 | 09 | 17 |
| අනියම් | - | - | - | 07 | 68 | 144 | - | - | - |
| එකතුව | 421 | 378 | 378 | 340 | 343 | 431 | 88 | 103 | 91 |

පහත නිරීක්ෂණය කෙරේ.

අනුමත කාර්ය මණ්ඩලයට පටහැනව 2009, 2010 හා 2011 වර්ෂයන්හිදී පිළිවෙලින් 91, 103 හා 88 ක පුරප්පාඩු ඇති බව නිරීක්ෂණය වූ අතර එම පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 **පාර්තෝෂික සඳහා අරමුදල**

-------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.31,214,220 ක් වූ පාර්තෝෂක ප්‍රතිපාදනය ආවරණය කර ගැනීමට පාර්තෝෂික අරමුදලක් ගොඩනගා නොතිබුණි.

3.6 **වාහන උපයෝජනය**

----------------------

මණ්ඩලය විසින් භාවිතා කරන ජීප් නවයක හා එක් කැබ් රථයක අයිතිය දීර්ඝ කාලයක සිට මණ්ඩලය වෙත මාරු කර නොතිබුණි. මෙම වාහන වලින් කිහිපයක් ආදායම් බලපත්‍ර හා රක්ෂණ ලබා ගැනීමෙන් තොරව මණ්ඩලය විසින් භාවිතා කර තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **සංයුක්ත සැලැස්ම**

---------------------

2009 - 2012 දක්වා කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව එය 2011 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

4.2 **ක්‍රියාකාර සැලැස්ම**

---------------------

මිරිස් , පොල් , උක් , බඩ ඉරිඟු , මල් පැල , වෙනත් භෝග , එළවළු , ගවයන් , එළුවන් ගබඩා , කෘෂි උපකරණ , සුවසෙත සහ ජීවිත රක්ෂණයට අදාළ රක්ෂණයන් සම්බන්ධයෙන් 2011 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මේ දක්වා තිබූ ඇතැම් ඉලක්කයන් ඉටුකර ගෙන නොතිබූ බවත් හා එය යහපාලනය පිළිබඳ ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

4.3 **අභ්‍යනතර විගණනය**

----------------------

අභ්‍යන්තර විගණනය ස්ථාපන කිරීම හා මෙහෙයුම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් සහ ආචාර ධර්ම**

-----------------------------------------------

2009 ඔක්තෝබර් 07 දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක ඩීඑම්ඒ/ 2009(3) දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය හා අභ්‍යන්තර විගණන වැඩ සටහන මණ්ඩලය විසින් සැලසුම් කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩ සටහන පිළියෙල කිරීමේදී පහත දැක්වෙන අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් අනුගමනය කර නොතිබුණි.

2 පරිශිෂ්ටය - කාර්ය සාධන ප්‍රමිතීන් - අංක 2201 - සැලසුම් සැලකිල්ලට ගැනීම

(ආ) 2011 වර්ෂය සඳහා වාර්ෂික විගණන වැඩ සටහනෙහි සැලසුම් කරන ලද පහත දැක්වෙන ක්ෂේත්‍රයන් හා කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) බැරකම්

(ii) මණ්ඩලයේ සමස්ථ කාර්ය සාධනය

**4.4 අයවැය ලේඛනමය පාලනය**

**------------------------------**

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි අභ්‍යන්තර පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) රක්ෂණ යෝජනා ක්‍රම
(ආ) හානි රක්ෂණ ගෙවීම
(ඇ) නීති , රීති හා රෙගුලාසි වලට අනුකූලවීම
(ඈ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම
(ඉ) අයවැය
(ඊ) සෙවක ණය හා අත්තිකාරම් නිරවුල් කිරීම
(උ) අභ්‍යන්තර විගණනය